මතුගම ප්‍රාදේශිය සභාව
කළුතර දිස්ත්‍රික්කය
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගන්නා ලද රු.3,301,809 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.34,000,000 ක් වූ මුද්දර ගාස්තු ආදායම වෙනත් ආදායම් යටතේ නොදක්වා සේවා සඳහා ගාස්තු යටතේ දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාළ රු.2,040,000 ක වියදමක් සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.300,000 ක් වූ ආදායම් ආධාර මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) වැඩසටහන් 03 යටතේ දැක්විය යුතු රු.35,448,117 ක් වූ කර්මාන්ත වියදම වැඩසටහන් 06 යටතේ දක්වා තිබුණි.

(ඊ) මහජන බැංකුවේ ස්ථාවර තැන්පත් ගිණුම් අංක 070-60-01-00009557-9 ට අදාළ පොලී ආදායම රු.1,212,866 ක් වුවත් එය රු.1,231,873 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් වර්ෂයේ පොලී ආදායම රු.19,007 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගත් රු.1,460,097 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා සමාලෝචිත වර්ෂය ආරම්භයට තිබූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල වටිනාකම අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ රු.625,361 ක සහා කර්මාන්ත ණයහිමි ශේෂයක් දෙවරක් ගිණුම්ගත වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ණයහිමි ශේෂය රු.625,361 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂයේදී ගෙවූ රු.123,412 ක වියදම් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

1:3:2 **නොසැසඳුණු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.4,478,500 ක් වූ ගිණුම් විෂයකට අදාළ ශේෂය හා එයට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.5,000,000 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

1.3.3 <u>ලැබිය යුතු ගිණුම්</u>

වසර ගණනාවක සිට අයවීමට තිබූ රු.358,225 ක් වූ විථි ආලෝක ආධාර ශේෂයක් හා රු.96,000 ක් වූ පෞද්ගලික බස් නැවතුම්පල ගාස්තු ශේෂයක් විය.

1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>

සේවක විස්තර සහ උපලේඛන නොමැති වීම නිසා රු.10,586,462 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය / සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | |
| (i)147 හා 149 වගන්ති | 472,773 | 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනත යටතේ සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති හෝටලයක් සඳහා බලපත්‍ර ලබාදීමේදී වර්ෂයේ ලැබීම් වලින් සියයට එක දක්වා ගාස්තුවක් අය කළ යුතු වුවත් මතුගම තානායමින් එකී ගාස්තු අඩුවෙන් අයකර තිබුණි. |
| (ii) 154 (1) වගන්තිය | ---- | සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් සියයට එකක ආදායමක් සභාව විසින් ලබාගෙන නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතී 218 | 297,120,250 | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 02 දිනැති අංක 1996 ගැසට් පත්‍රය IV (ආ) කොටස | 16,900 | සභාව මගින් සිදුකරන ලද සමීක්ෂණ අනුව හඳුනාගන්නා ලද දැන්වීම් පුවරු 12 කට අදාළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 1,616,579 | කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් අදාළ කාර්යය නිම වූ විගසම පියවිය යුතු වුවත් එසේ කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii)මුදල් රෙගුලාසි 571 | 7,992,379 | කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | | සභා වාහන වල ඉන්ධන දැවීම් පරීක්ෂා කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2:1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,752,763 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,137,349 ක් විය.

2:2 ආදායම් පරිපාලනය

2:2:1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 18,123,000 | 14,281,441 | 12,572,290 | 3,947,643 | 17,403,900 | 15,072,763 | 12,438,691 | 4,724,675 |
| (ii) කුලී | 5,785,300 | 8,537,997 | 8,202,507 | 523,841 | 5,619,500 | 5,395,650 | 4,949,251 | 446,399 |
| (iii) බලපත්‍ර ගාස්තු | 400,000 | 392,500 | 372,250 | 20,250 | 245,000 | 267,471 | 267,471 | - |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.5,019,438 ක් වූ අතර වර්ෂය තුළ බිල් කිරීම රු.23,211,938 ක් විය. වර්ෂය තුළ ලැබීම්, කපාහැරීම් හා ගැලපුම් රු.23,739,643 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ ආදායම් හිඟය රු.4,491,733 ක් විය.

2.2.3 **වරිපනම් හා බදු**

**වරිපනම්**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.4,303,939 ක වරිපනම් බදු හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.2,249,686 ක් හෙවත් සියයට 52 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කිරීම රු.11,974,964 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.10,211,440 ක් හෙවත් සියයට 85 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් ආදායම රු.4,491,733 ක් වූ අතර සමස්ථ අයකිරීමේ ප්‍රගතිය සියයට 74 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වරිපනම් සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකෙරිණි.

2.2.4 කුලී

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.601,184 ක වෙළඳ ස්ථාන කුලී හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.412,834 ක් හෙවත් සියයට 69 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට වෙළඳ ස්ථාන කුලී බිල් කළ ආදායම රු.5,420,529 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.5,085,039 ක් හෙවත් සියයට 94 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.523,841 ක හිඟයෙන් රු.188,350 ක් පෙර වර්ෂ වලට අදාළ හිඟයක් විය.

2.2.5 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.100,200 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.35,400 ක් හෙවත් සියයට 35 ක් පමණක් අයකරගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.121,620 ක හිඟ ව්‍යාපාර බදු ශේෂයෙන් රු.23,400 ක් පෙර වර්ෂ වලට අදාළ හිඟයක් විය.

2.2.6 වෙනත් ආදායම්

දැන්වීම් පුවරු ආදායම්

සභා බල ප්‍රදේශයේ සිදු කරන ලද නියැදි භෞතික පරීක්ෂාවට අනුව දැන්වීම් පුවරු 35 කින් රු.119,600 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.7 උසාවි දඩ

මුද්දර ගාස්තු

2017 වර්ෂය සඳහා මුද්දර ගාස්තු හා උසාවි දඩ ලෙස පිළිවෙලින් රු.34,000,000 ක් හා 1,000,000 ක් බිල් කිරීම් කළද කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3:1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 03 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 08 වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ප්‍රතිපාදන නොසැලසීම

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සෞඛ්‍යය හා සුභසාධන සේවා වෙනුවෙන් සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 28 කගෙන් 06 ක් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) <u>අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම</u>
2017 වර්ෂයේදී සභා අරමුදල් වලින් නිම කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 42 න් 14 ක් වර්ෂය අවසාන වන විටත් නිම කර නොතිබුණි.

(ඉ) <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>
2017 වර්ෂය සඳහා කසළ කළමනාකරණය වෙනුවෙන් සභාව විසින් රු.14,826,603 ක වියදමක් දරා තිබූ අතර එකී වියදම් පියවා ගැනීමට හෝ අවම කර ගැනීම පිණිස කසළ බදු පැනවීමක් සිදු කර නොතිබුණි.

(ඊ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>
තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 ජුනි 18 දින වන විටත් සකස් කර නොතිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) සභාව වෙත අයවිය යුතු කඩකුලී, ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හා බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (4) හා 152(4) ජේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රවනාගාරය වෙන් කිරීමේ ගාස්තු හා ශ්‍රවනාගාරය කුලියට දෙනු ලබන අවස්ථා වලදී සහණදායි මිළ ගණන් මත ලබාදීම සඳහා ගත් ප්‍රතිපත්තිමය තීරණය ඇතුළත් කමිටු තීරණයක් ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) පොදු වෙළඳපොලේ ඇති කඩකාමර 105 න් 37 කට විදුලිය සැපයීමට කටයුතු කර නොතිබූ අතර ඉන් කඩ කාමර 07 කට තාවකාලිකව විදුලිය ලබා දී දෛනිකව ගාස්තු අයකිරීමට කටයුතු කර තිබුණි.

3:3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) සභාවේ තනතුරු 24 කට අදාළව අනුමත කාර්ය මණ්ඩලය 174 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 160 ක් විය. ඒ අනුව තනතුරු 09 ක පුරප්පාඩු 14 ක් නිරික්ෂණය වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලයට අතිරේකව ආදේශක පදනමින් 07 ක්, කොන්ත්‍රාත් පදනමින් 03 ක් හා වැඩ බැලීමේ පදනමින් 05 ක් බඳවාගෙන තිබුණි. තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 ප්‍රකාරව තනතුරු 06 කට අදාළව නිලධාරින් 42 ක් බඳවාගෙන තිබුණි.

(ආ) තනතුරුවලට අදාළ කාර්යයන්ගෙන් බැහැරව වෙනත් කාර්යයන්හි යොදවා ඇති සේවක සංඛාව 45 ක් විය.

(ඇ) සභාව සතුව වාහන 17 ක් තිබෙන නමුත් ස්ථිර රියදුරන් සිටිනුයේ 07 ක් පමණි. රියදුරු පුරප්පාඩු සපුරාගැනීම සඳහා සභාවේ කම්කරුවන්ගේ හා කාර්යාල කාර්ය සහයකවරුන්ගේ සේවය ලබාගෙන තිබුණි.

3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) <u>වරිපනම්</u>

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ පිහිටි වැලිපැන්න හා හොරවල උපකාර්යාල වලට අයත් දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන තිබුණද, සභා තීරණයක් මගින් එකී දියුණු කළ ප්‍රදේශවලින් වරිපනම් බදු අයකිරීම සඳහා ඇමතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) වරිපනම් බදු ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ තුළ වූ තක්සේරු නොවූ දේපළ පිළිබඳ ලැයිස්තුවක් සභාවේ නොතිබුණි.

(ආ) <u>දේපළ බදුදීම</u>

(i) මතුගම පොදු වෙළඳපොලේ කුලියට ලබා දී ඇති කඩකාමර 38 කට අදාළව බදු ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

(ii) අතුරු බදුකරුවන් 24 ක් සඳහා 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව නිත්‍යානුකූල බදු අයිතිය පැවරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(iii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (2) ජේදය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන නිතීඥ කාර්යාල වලින් බදු අයකර නොතිබුණි.

3.5 <u>අවිධිමත් ගනුදෙනු</u>

2013 අප්‍රේල් 22 දිනැති අංක 05/2013 හා 2016 අගෝස්තු 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව රියදුරු හා කාර්යාල සේවක සේවයේ සේවකයින් සඳහා පමණක් නිල ඇඳුම් හා මැහුම් කුලී දීමනාව හිමිවන බව දක්වා ඇතත් සෞඛ්‍ය කම්කරුවන් 39 ක් සඳහා රු.156,000 ක නිල ඇඳුම් දීමනාවක් ගෙවා තිබුණි.

3.6 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>

2017 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර මිළ ගණන් කැඳවීම සිදුකර තිබුණද එකී මිළ ගණන් මත මිළදී ගැනීම් සිදු නොකර 2016 වර්ෂයේදී ඉදිරිපත් කළ මිළ ගණන් මත මිළදී ගැනීම් සිදු කිරීම නිසා 2017 වර්ෂය සඳහා මිළ ගණන් කැඳවීමට පුවත්පත් දැන්වීමක් පල කිරීම සඳහා වැයකර තිබූ රු.34,931 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

3.7 <u>හඳුනාගත් පාඩු</u>

(අ) 2017 වර්ෂය සඳහා මිළදී ගැනීම් සිදු කිරීමේදී 2016 වර්ෂයේ මිළ ගණන් මත මිළදී ගැනීම නිසා අයිතම 06 ක් මිළදී ගැනීමේදී රු.496,680 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) විදුලි භාණ්ඩ නිකුත් කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලන දුර්වලතාවයක් නිරීක්ෂණය වූ අතර භෞතික පරීක්ෂාවට අනුව රු.126,095 ක් වූ වොට් 23 ප්‍රතිදීප්ත (CFL) බල්බ 207 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

3.8 <u>ප්‍රසම්පාදනය</u>

3.8.1 <u>සැපයීම් හා සේවා</u>

ගෝල්පෝස්ට් දෙකක් මිළදී ගැනීම සඳහා සභාව විසින් රු.275,000 ක් වැය කර තිබූ අතර එම ගෝල්පෝස්ට් දෙකෙහි ප්‍රමිති අනුව තිබිය යුතු විෂ්කම්භය අඟල් 05 ක් විය යුතු වුවත් භෞතික පරීක්ෂාවේදී එහි පැවතියේ අඟල් 4.45 ක විශ්කම්භයක් බවත් නිරීක්ෂණය විය.

3.8.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

මැද්දෙගෙදර මතුගමවත්ත පොදු මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.498,835 ක වියදමක් දරා තිබුණද සැලසුම් අනුව මීටර් 220 ක් දිග තිබිය යුතු මාර්ගය භෞතික පරීක්ෂාවේදී පැවතියේ මීටර් 216.3 ක් පමණි.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

4:1 **<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ අයවැය ගත හා තථ්‍ය ආදායම් සියයට 19 සිට සියයට 320 දක්වා සහ වියදම් සියයට 01 සිට සියයට 37 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| <u>පද්ධතිය</u> | <u>අඩුපාඩුව</u> |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ගිණුම් වලින් අත් හැරීම් තිබීම<br>ii. ගිණුම් වල අඩුවෙන් හා වැඩියෙන් සටහන් වී තිබීම |
| (ආ) ණයහිමියෝ/තැන්පතු | උපලේඛන පිළියෙල නොකිරීම |
| (ඇ) සේවක කළමනාකරණය | අනුයුක්ත රාජකාරියෙන් බැහැර රාජකාරි වල යෙදීම හා තනතුරු වල පුරප්පාඩු හා අතිරික්තතා පැවතීම |
| (ඈ) ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම |
| (ඉ) ආදායම් පරිපාලනය | කඩකුලී හා විදුලිය සඳහා අයකිරීමේ ප්‍රමාදයන් තිබීම |
| (ඊ) අයවැය | i. අයවැය සහ තථ්‍ය අගයන් අතර විශාල විචලනයන් පැවතීම<br>ii. ආදායම් ඇස්තමේන්තු කිරීමේදී තාත්වික අයුරින් සිදු නොවීම |